**ශීර්ෂය 289 - අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 වන දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතුනිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙළ කර තිබුණු මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.1,098,889,538 ක් වුවද එය සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරියට ගෙන ඒමේදී රු.1,102,130,963 ක් ලෙස දක්වා තිබුණි. එබැවින් සමාලෝචිත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දේපළ පිරියත හා උපකරණ අගය රු.3,241,425 ක් වැඩියෙන් දැක්වේ. | ඉදිරියේ දී මෙම වරද නිවැරදි කරන බව. | ඉකුත් වර්ෂයේ මූලය ප්‍රකාශනවල සඳහන් ශේෂ නිවැරදිව සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරියට ගෙන යා යුතුය. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අග්‍රිම ලැබීම් රු.49,679,014 ක්ද තැන්පතු ලැබීම් රු.1,145,182 ක්ද අත්තිකාරම් ලැබීම් රු.41,938,711 ක්ද අඩුවෙන් දක්වා තිබුණු අතර වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් රු.468,061,621 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිරීක්ෂණය පිළිගන්නා බව හා ඉදිරියේ දී මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කිරීමේ දී චක්‍රලේඛ උපදෙස් අනුව පිළියෙල කරන බව. | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 බැදීම් හා බැරකම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ වියදම් සඳහා අවස්ථා 8 කදී, ඇති කරගත් බැදීම් වෙනුවෙන් ගෙවිය යුතු රු.111,308 ක බැරකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට මෙම බැරකම් හඳුනාගෙන නොතිබුණු බව. | එක් එක් ආකෘතියෙහි අඩංගු විය යුතු තොරතුරු හෙළිදරව් කළ යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | | |
| | | රු. | | | |
| (අ) | 1992 අංක 46 දරන අපනයන කෘෂිකර්මාන්තය ප්‍රවර්ධන පනත<br>15(1) වගන්තිය | 602,900,000 | අපනයන ප්‍රවර්ධන ආධාර ගෙවිය යුත්තේ නිවේදිත කෘෂිකාර්මික බෝග වගා කරන සහ සකස් කරන තැනැත්තන්ට සහනාධාර සහ මූල්‍යමය හෝ අන්‍යාකාර වූ වෙනත් ආධාර ප්‍රදානය කිරීමේ යෝජනා ක්‍රම සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු | ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට සටහන් කරගත් බව. | පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ලැබීමෙන් පසුව වුවද එවැනි නියෝග සැදීමකින් තොරව අපනයන ප්‍රවර්ධන ආධාර ගෙවා තිබුණි. | | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>------------------<br>XIV පරිච්ඡේදය 4.4 වගන්තිය | 44,100 | සේවා ස්ථානයෙන් බැහැරව රාජකාරී සඳහා ගත කරන පැය 12 කට නොඅඩු කාල පරිච්ඡේදයක් සඳහා සම්පූර්ණ සංයුක්ත දීමනාවද, පැය 6 කට නොඅඩු කාල පරිච්ඡේද සඳහා සංයුක්ත දීමනාවෙන් අඩක්ද ගෙවිය හැකි අතර පැය 6 කට අඩු කාල පරිච්ඡේදයක් සඳහා ගෙවිය නොහැකිය. එහෙත් එම විධිවිධාන නොසලකා සංයුක්ත දීමනා ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා ඇති සංයුක්ත දීමනා ආපසු අයකර ගැනීමට පියවර ගෙන තිබෙන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ඇ) | 2016 මාර්තු 17 දිනැති අංක 01/2016(1) දරන ජාතික අයවැය චක්‍රලේඛය | 12,996,000 | මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වාහන ලබා ගැනීමේදී අධ්‍යක්ෂ හා ඊට සමාන මට්ටමේ නිලධාරීන් සඳහා ලබා ගන්නා වාහනයක උපරිම මාසික බදු කුලිය (එකතු කළ අගය මත බදු රහිත) රු.135,000 ක් විය යුතුය. එසේ වුවද දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් ඇතුලු | සංචිතය සඳහා ලබාගත් වාහන පසුව අධ්‍යක්ෂවරුන් වෙත අනුයුක්ත කිරීම නිසා මෙම තත්ත්වය ඇති වූ බව. | චක්‍රලේඛ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

අධ්‍යක්ෂවරුන් 08 දෙනෙකු සඳහා ලබාගෙන අනුයුක්ත කර තිබුණු වාහන සඳහා මසකට රු.163,500 බැගින් ගෙවා තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගොස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කළ යුතුව තිබුණු අතර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව එය වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | විගණන වාර්තාව ලැබුණු පසු කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරන බව. | විගණන පනතේ විධිවිධාන අනුගමනය කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතුව රජයේ නිවාස 90 ක් පැවති අතර ඉන් නිවාස 07 ක් අබලන් තත්ත්වයේ පැවතුණි. එමෙන්ම නිලධාරීන් පදිංචි නිවාස 32 ක් පැවති අතර එම නිවාස වැසි දිනවලදී ජලය කාන්දු වීම, වැසිකිළි කැඩී බිඳී තිබීම, විදුලිබලය නොතිබීම, ජලනල පද්ධතියේ ගැටලු පැවතීම ආදී අඩුපාඩු පවතින බැවින් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි. | වෙන් වූ ප්‍රතිපාදන අත්‍යවශ්‍යම ව්‍යාපෘති සඳහා යොදවන ලද බැවින් මෙම අලුත්වැඩියා කටයුතු කළ නොහැකි වූ බව. | රජයේ නිවාස අබලන් වීමට ඉඩ නොහැර නඩත්තු කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | තක්සේරු වටිනාකම රු.3,000,000 ක වාහන 3 ක් වසර 5 කට අධික කාලයක් භාවිතයට යොදා නොගෙන තිබුණි. | මෙම වාහන වෙන්දේසි කිරීමට නියමිතව ඇති බව. | අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ එසේ නොහැකි නම් අපහරණය කිරීමට පියවර ගත යුතුය. |

**3.3 පාඩු හා හානි**

--------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පසුගිය වර්ෂවලදී සිදුව තිබුණු අලාභ හානි සිද්ධි 4 කට අයත් රු.3,926,808 ක අලාභ තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට තිබුණු අතර ඉන් රු.2,348,453 කට අදාළ සිද්ධි 2 ක් වසර 5 කටත් පෙර පටන් පවතින බව නිරීක්ෂණය විය. | රු.2,250,000 ක අලාභ අදාළ වගකිව යුතු අයගෙන් අයකර ගැනීමට නියමිත අතර, ඉතිරි අලාභ පොත්වලින් කපාහැරීම සඳහා කටයුතු කරමින් පවතින බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 කළමනාකරණ දුර්වලතා**

---------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවට අයත් ගස්නාව පිහිටි පැළ තවානට 2018 දෙසැම්බර් මස ලැබී තිබුණු රොක්පොස්පේට් සහ ඩොලමයිට් ඇතුළු වර්ග 05 කට අයත් රසායනික පොහොර කිලෝග්‍රෑම් 2873 ක් 2021 දෙසැම්බර් වන විටත් භාවිතයට ගෙන නොතිබුණු අතර, ඉන් වර්ග 3 කට අයත් පොහොර කිලෝග්‍රෑම් 853 ක් කල් ඉකුත් වී තිබුණි. | ගොවිපළ කම්කරුවන් වෙනත් සංවර්ධන කටයුතුවල නිරත කරවූ බැවින් 2018 වර්ෂයේ දී ලබා ගන්නා ලද රසායනික පොහොර සියල්ලම ක්ෂේත්‍රයට යෙදවීමට නොහැකි වූ බව. | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන මිලදී ගැනීම් කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

--------------------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගත යුතු වුවද, ආයතනය විසින් ඔවුන් හඳුනාගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට අදාළ ඉලක්ක පිළියෙළ කිරීමේදී සහභාගීත්ව ප්‍රවේශයක් නිරූපණය නොවුණි. | ඉදිරියේ දී දෙපාර්තමේන්තුවේ සංවර්ධන හා පර්යේෂණ ඉලක්ක සකස් කිරීමේ දී මේ සම්බන්ධව වැඩි අවධානය යොමු කිරීමට සටහන් කරගත් බව. | තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් විය යුතු අතර, ඒ සඳහා අදාළ කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | -------------------------- | ------------ |
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටමේ පැවති පුරප්පාඩු 23 න් 16 ක් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයට අයත් සහකාර අධ්‍යක්ෂ තනතුරු වූ අතර එය දෙපාර්තමේන්තුවේ කටයුතු සම්බන්ධයෙන් අහිතකර ලෙස බලපා තිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතින බව. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |
| (ආ) | දිස්ත්‍රික් / විෂයානුබද්ධ ව්‍යාපෘති නිලධාරී තනතුරෙහි පුරප්පාඩු 16 ක් පැවති අතර එය ක්ෂේත්‍ර කටයුතු මනාලෙස පවත්වාගෙන යාමට බාධාවක්ව පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතින බව. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |
| (ඇ) | පර්යේෂණ හා සංවර්ධන සහකාර තනතුරු 84 ක් අනුමත කර තිබුණු නමුත් එම තනතුර සඳහා කිසිදු නිලධාරියෙකු බඳවාගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතින බව. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන පුරප්පාඩු පිරවිය යුතුය. |
| (ඈ) | අනුමත කාර්යමණ්ඩලයට අයත් නොවන මුරකරු සහ කම්කරු සේවකයින් 114 දෙනෙකු සේවයේ යොදවා තිබුණු නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එම තනතුරු අනුමත කර නොතිබුණි. | කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් ඉල්ලීමක් කර තිබෙන නමුත් ඊට අනුමැතිය ලැබී නොමැති බව. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන තනතුරු අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |